PSC/EST/02-01-18/02/2

| | | |
|---|---|---|
| දුරකථන<br>தொலைபேசி<br>Telephones | 011-2136600<br>011-2136650<br>011-2136700 | |
| ලේකම්<br>செயலாளர்<br>Secretary | 011-2136602 | |
| ෆැක්ස්<br>தொலைநகல்<br>Fax | 011-2369302<br>011-2369305 | |
| විද්‍යුත් තැපැල<br>மின் - அஞ்சல்<br>E - mail | sec-psc@sltnet.lk | |
| වෙබ් අඩවිය<br>இணையத்தளம்<br>Website | www.psc.gov.lk | |

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය

அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்

OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 177, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05.
இல. 177, நாவல வீதி, நாரஹேன்பிட்ட, கொழும்பு 05.
**No. 177, Nawala Road, Narahenpita, Colombo 05.**

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No. MRPR/2/3/17-12

දිනය / திகதி / Date 2014.12.23

ලේකම්,

පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය.

**<u>නියාමක බඳවා ගැනීමේ පරිපාටිය සඳහා අනුමැතිය ලබා ගැනීම.</u>**

උක්ත කරුණ හා සම්බන්ධ ඔබේ සමාංක හා 2014.12.10 දිනැති ලිපිය හා බැඳේ.

02. ඒ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද, එම කොමිෂන් සභාවේ ලේකම්ගේ අත්සනින් යුත් උක්ත බඳවා ගැනීමේ පරිපාටියේ මුල් පිටපත මේ සමඟ එවමි.

03. මේ පිළිබඳව අදාළ නිලධාරීන් දැනුවත් කරන ලෙසත්, අදාළ බඳවා ගැනීමේ පරිපාටිය ඔබ අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ පළකරන ලෙසත් වැඩිදුරටත් දන්වමි.

ටී.ඩබ්ලිව්. ගයාන්
සහකාර ලේකම් (ආයතන)
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ
ලේකම් වෙනුවට

පිටපත් -

01. ලේකම් - ජාතික වැටුප් කොමිෂන් සභාව - (මුල් පිටපත මේ සමඟ එවමි.)
02. ආයතන අධ්‍යක්ෂ ජනරාල් - (මුල් පිටපත මේ සමඟ එවමි.)
03. කොමසාරිස් ජනරාල් - බන්ධනාගාර දෙපාර්තමේන්තුව - (මුල් පිටපත මේ සමඟ එවමි.)

බන්ධනාගාර දෙපාර්තමේන්තු පොලිස් හා අනිකුත් නියාමක සේවා ගණයේ

බන්ධනාගාර නියාමක තනතුරු සඳහා වන

බඳවා ගැනීමේ පටිපාටිය.

01. සම්බන්ධ වන ආයතන

| | | |
|---|---|---|
| 1.1 දෙපාර්තමේන්තුව : බන්ධනාගාර | යොමු අංකය : ඩී8/21/බ.පරි/නි.නි. | දිනය : 2014.02.06 |
| 1.2 අමාත්‍යාංශය : පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ | යොමු අංකය :MRPR/2/317-12 | දිනය :2014.02.21 |
| 1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම : | යොමු අංකය :DMS/B2/48/01/Vol-II | දිනය :2013.09.24 |
| 1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය : | යොමු අංකය :EST-2/RECRU/05/4858 | දිනය :2014.05.05 |
| 1.5 ජාතික වැටුප් කොමිෂන් සභාවේ නිර්දේශය : | යොමු අංකය :NCP/6/18/096/SR | දිනය: 2013. 04. 09<br>2014. 04. 21<br>2014. 05. 12 |
| 1.6 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය : | යොමු අංකය : PSC/EST-02-01-18/02/2014 | දිනය :2014. 11. 20 |

02. පත් කිරීම් බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

03. සේවා ගණය පිළිබඳ විස්තර

3.1 සේවා ගණය : පොලිස් හා අනෙකුත් නියාමන සේවා.

3.2 ශ්‍රේණි : බන්ධනාගාර නියාමක,
බන්ධනාගාර සැරයන්

3.3 පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය :

බන්ධනාගාර ආයතනයන්හි පරිපාලනයට සහාය වීම සහ බන්ධනාගාරගත නේවාසිකයන්ගේ ආරක්ෂාව සැලසීම සහ ඔවුන් ආරක්ෂණය කිරීමට සහාය වීම.

3.4 කාර්යයන් පැවරීම :

ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර, මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාවය මත ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයකුට දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැක.

04. තනතුරෙහි/ තනතුරුවල ස්වභාවය : ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත

## 05. වැටුප්

5.1 වැටුප් කේත අංකය : RS-1-2006A

5.2 වැටුප් පරිමාණය : 14280/ - 7 x 145 - 10 x 180 - 17 x 240 - 21175/-

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර : 14280/-

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු) |
|---|---|---|
| නියාමක | 01 | 14280/- |
| සැරයන් | 09 | 15475/- |

## 06. සේවා ගණයට අයත් තනතුර/තනතුරු

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :

| අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණිය | | අනුමත තනතුරු සංඛ්‍යාව | | කාර්යයන් |
|---|---|---|---|---|---|
| බන්ධනාගාර නියාමක | පිරිමි | | පිරිමි | 4447 | බන්ධනාගාර නේවාසිකයින්ගේ ආරක්ෂාව හා රැකවරණය ලබා දීම, අධිකරණවලට ඉදිරිපත් වීම සහ අධිකරණ නියෝග ක්‍රියාත්මක කිරීම. ආරක්ෂණ හා අනෙකුත් කටයුතු වලදී කාර්යභාර නිලධාරි වශයෙන් කටයුතු කිරීම. ගබඩා රාජකාරී ඉටු කිරීම. |
| | කාන්තා | | කාන්තා | 514 | |
| සැරයන් | පිරිමි | | පිරිමි | 892 | |
| | කාන්තා | | කාන්තා | 38 | |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : බන්ධනාගාර නියාමක (පිරිමි/කාන්තා) - 4961

සැරයන් (පිරිමි/ කාන්තා) - 930

## 07. බඳවාගැනීමේ ක්‍රමය

7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන් :

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | 95% |
| සීමිත | 05% |
| කුසලතා | - |

**සටහන :** බඳවා ගැනීම් යටතේ සීමිත බඳවා ගැනීම් 05%ක නිලධාරීන් සංඛ්‍යාවක් නොමැති අවස්ථාවේදී එම අඩු සංඛ්‍යාවද විවෘතව බඳවා ගනු ලැබේ.

7.2 විවෘත බඳවා ගැනීම

7.2.1 බඳවා ගන්නා ශ්‍රේණිය : බන්ධනාගාර නියාමක.

7.2.2 සුදුසුකම් :

7.2.2.1 අධ්‍යාපන සුදුසුකම් : අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී සිංහල/දෙමළ/ඉංග්‍රීසි හා ගණිතය ඇතුළුව සම්මාන 02ක් සහිතව විෂයයන් හයක් (06) දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත් වී තිබීම

7.2.2.2 වෘත්තිය සුදුසුකම් : අදාළ නොවේ.

7.2.2.3 පළපුරුද්ද : අදාළ නොවේ.

7.2.2.4 කායික සුදුසුකම් :

I. අවම උස අඩි 05 අඟල් 04 (පිරිමි.
II. අවම උස අඩි 05 අඟල් 02 (කාන්තා)
III. පිරිමි අයදුම්කරුවන් සඳහා පපුව හුස්ම නාල්ලා අඟල් 32ක් විය යුතුය.

7.2.2.5 වෙනත් සුදුසුකම් :

I. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුයි.
II. මනා සෞඛ්‍යයකින් යුක්ත විය යුතු අතර, යහපත් චරිතයකින් ද යුක්ත අයවලුන් විය යුතුයි.
III. චරිත දූෂණයට අදාළ වරදක් සම්බන්ධයෙන් ඕනෑම අධිකරණයක් විසින් වරදකරු කරු කරනු ලැබීම ඉහත තනතුරට පත්වීම සඳහා සම්පූර්ණ නුසුදුසුකමක් වන්නේය.
IV. තනතුරට බඳවා ගැනීම සඳහා 7.2.2.1 සිට 7.2.2.4 දක්වා සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බව අයදුම්පත් කැඳවීමේනිවේදනයේ/ ගැසට් පත්‍රයේ සඳහන් වන දිනට එම සුදුසුකම් සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කළ යුතුය.

7.2.3 වයස

7.2.3.1 අවම සීමාව : අවු. 18
7.2.3.2 උපරිම සීමාව : අවු. 30

7.2.4 බඳවා ගැනීමේ ක්‍රමය

7.2.4.1 ලිඛිත විභාගය : අදාළ නොවේ.

7.2.4.2 වෘත්තීය පරීක්ෂණය : අදාළ නොවේ.

7.2.4.3. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : අදාළ නොවේ.

7.2.4.4 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

| පරීක්ෂා කර ලකුණු ලබාදෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අතිරේක අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් | 25 | අදාළ නොවේ. |
| වෘත්තීය සුදුසුකම් | 15 | |
| ක්‍රීඩා කෞෂල්‍යය | 30 | |
| නායකත්වය හා ප්‍රජා සේවාවන් | 25 | |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාව | 05 | |
| එකතුව | 100 | |

සටහන

(I) ඉහත වගුවෙහි දැක්වන ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයන් ඇතුළත, එක් එක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා විස්තරාත්මක ලකුණු පරිපාටියක් අනුමත කිරීම බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් සිදු කරනු ඇත.

(II) සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගන්නා මුලු ලකුණු වල කුසලතා අනුපිළිවෙල අනුව හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරු වලට බඳවා ගනු ලැබේ.

(III) අයදුම්පත් අනුව තනතුරට අදාළ මූලික සුදුසුකම් සපුරා තිබේදැයි සලකා බැලීම සඳහා බන්ධනාගාර දෙපාර්තමේන්තුව මගින් මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමට පරීක්ෂණයක් පවත්වන අතර, සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් හට ශාරීරික යෝග්‍යතා පරීක්ෂණයක් හෙවත් ඔරොත්තු දීමේ පරීක්ෂණ, එනම් දරාගැනීමේ ශක්තිය උරගා බැලීමේ පරීක්ෂණයක් පවත්වනු ලැබේ.

මීටර් 1000 - මිනිත්තු 03 තත්පර 44

(IV) යෝග්‍යතා පරීක්ෂණය හෙවත් ඔරොත්තු දීමේ පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් පමණක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

7.2.4.4.1. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා : බන්ධනාගාර කොමසාරිස් ජනරාල්.

7.2.5. අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : රජයේ ගැසට් පත්‍රයේ දැන්වීමක් පළ කිරීමෙන් හෝ පුවත්පත් දැන්වීමක් පළ කිරීමෙන් සහ වෙබ් අඩවියෙහි පළ කිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

7.3. සීමිත බඳවා ගැනීම

7.3.1. බඳවා ගන්නා ශ්‍රේණිය : බන්ධනාගාර නියාමක.

7.3.2. සුදුසුකම් :

7.3.2.1. අධ්‍යාපන සුදුසුකම් : අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී සිංහල/දෙමළ/ඉංග්‍රීසි හා ගණිතය ඇතුළුව සම්මාන 02ක් සහිතව විෂයයන් හයක් (06) දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත් වී තිබීම

7.3.2.2. වෘත්තීය සුදුසුකම් : අදාළ නොවේ.

7.3.2.3. පළපුරුද්ද : වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති තනතුරේ ස්ථිර කර ඇති බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සේවය කරන ප්‍රාථමික ශ්‍රේණියේ නිලධාරියෙකු විය යුතුය. නැතහොත් තනතුරේ ස්ථිර කර ඇති වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සහිත බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ අවම වශයෙන් වසර 03ක් සේවය කර ඇති ඒකාබද්ධ සේවයේ ප්‍රාථමික ශ්‍රේණියේ නිලධාරියෙකු විය යුතුය.

7.3.2.4. කායික සුදුසුකම් : I. අවම උස අඩි 05 අඟල් 04 (පිරිමි.)
II. අවම උස අඩි 05 අඟල් 02 (කාන්තා)
III. පිරිමි අයදුම්කරුවන් සඳහා පපුව හුස්ම නාල්ලා අඟල් 32ක් විය යුතුය.

7.3.2.5. වෙනත් :

තනතුරට බඳවා ගැනීම සඳහා ඉහත 7.3.2.3 සිට 7.3.2.4 දක්වා සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවන නිවේදනයේ /ගැසට් පත්‍රයේ සඳහන් වන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කළ යුතුය.

7.3.3 වයස : අදාළ නොවේ.

7.3.4. බඳවා ගැනීමේ ක්‍රමය

7.3.4.1. ලිඛිත විභාගය : අදාළ නොවේ.

7.3.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය (ලකුණු ලබාදෙනු නොලැබේ.)
ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු : අදාළ නොවේ.

7.3.4.4. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

| ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| ප්‍රශංසා | 05 | අදාළ නොවේ. |
| ක්‍රීඩා | 10 | |
| යහපත් සේවයට වාර්තා කිරීම | 05 | |
| උසස් අධ්‍යාපන පුහුණුව | 05 | |
| ජ්‍යෙෂ්ඨතාවය | 20 | |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය | 05 | |
| එකතුව | 50 | |

සටහන :

(I) ඉහත වගුවෙහි දැක්වෙන ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයන් ඇතුලත එක් එක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා විස්තරාත්මක ලකුණු පරිපාටියක් අනුමත කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ඇත.

(II) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් ලබා ගන්නා මුළු ලකුණු වල කුසලතා අනුපිළිවෙළ අනුව හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරට බඳවා ගනු ලැබේ.

7.3.4.4.1. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා : බන්ධනාගාර කොමසාරිස් ජනරාල්.

7.3.5. අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : බන්ධනාගාර ආයතන ප්‍රධානින් දැනුවත් කිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

7.4 කුසලතා පදනම මත බඳවා ගැනීම : අදාළ නොවේ.

08. කාර්යක්ෂමතා කඩඉම

8.1

| කුමන කාර්යක්ෂමතා කඩඉමද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්ෂණය/වෘත්තීය පරීක්ෂණය/සහතික පාඨමාලාව/ වෙනත් |
|---|---|---|
| I වන කාර්යක්ෂමතා කඩඉම | නියාමක තනතුරට පත්වී වසර 03ක් ඇතුළත | ලිඛිත |
| II වන කාර්යක්ෂමතා කඩඉම | සැරයන් තනතුරට පත්වී වසර 03ක් ඇතුළත | ලිඛිත |

(විෂය නිර්දේශය සඳහා ඇමුණුම 01 බලන්න)

සේවයට බඳවා ගැනීමෙන් පසු සෑම වසර 2ටම වරක් ශාරීරික යෝග්‍යතා පරීක්ෂණයක් පවත්වනු ලබන අතර, එම පරීක්ෂණයෙන් සමත්විය යුතුය.) ශාරීරික යෝග්‍යතා මණ්ඩලය බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් පත්කරනු ඇත.

8.2 කාර්යක්ෂමතා කඩඉම් පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද : වසරකට දෙවරක්

8.3 කාර්යක්ෂමතා කඩඉම් වලට අදාළ පරීක්ෂණ පවත්වනු ලබන බලධරයන් කවුරුන්ද : බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

09. භාෂා ප්‍රවීනතාව

(පත්වීම ලැබී වසර 05ක් ඇතුලත සමත් විය යුතුයි.)

9.1

| භාෂාව | ලබාගත යුතු ප්‍රවීණතාව |
|---|---|
| රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුනු නිලධාරීන් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවයක් පරිවාස කාලය තුළ ලබාගත යුතුය. |
| අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට අනුෂංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ ප්‍රවීණතාවය ලබා ගත යුතුය. |

10. ශ්‍රේණි උසස් කිරීම.

10.1 නියාමක තනතුරේ සිට සැරයන් තනතුරට උසස් කිරීම.

10.1.1 සාමාන්‍ය මට්ටමේ කාර්ය සාධනය අනුව

10.1.1.1 සපුරාලිය යුතු සුදුසුකම් :

I. පත්වීම ස්ථිර කර තිබීම
II. උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට නියාමක ශ්‍රේණියේ අවම වශයෙන් වසර අටක (08) සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක අටක් (08) උපයාගෙන තිබීම.
III. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත්ව තිබීම.
IV. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහක් (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
V. අදාල මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගෙන තිබීම.
VI. අනුමත කාර්ය සාධන ඇගයීමෙ පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර අට (08) ක් තුළසතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම

10.1.1.2 පවතින පුරප්පාඩු වලින් 2/3ක් ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය මත හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් උසස් කරනු ලැබේ. (ඇමුණුම 02 බලන්න.)

10.1.2 ලිඛිත විභාගය මත

10.1.2.1 සපුරා ලිය යුතු සුදුසුකම් :

I. පත්වීම ස්ථිර කර තිබීම.
II. උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට නියාමක ශ්‍රේණියේ අවම වශයෙන් වසර අටක (08) සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක සියල්ල උපයාගෙන තිබීම.
III. අදාල කාර්යක්ෂමතාකඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත්ව තිබීම.
IV. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර අට (08) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
V. අදාල මට්මමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගෙන තිබීම.

10.1.2.2 උසස් කිරීමේ ක්‍රමය :

විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත පවතින පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් විභාගයේදී ඉහළම ලකුණු ලබාගත් අනුපිළිවල අනුව අවශ්‍ය මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයකට භාජනය කෙරෙන අතර ඉන් වැඩිම ලකුණු ලබාගන්නා අය සැරයන් තනතුරට උසස් කරනු ලැබේ. මෙමගින් පවතින පුරප්පාඩු වලින් 1/3 ක් සම්පූර්ණ කරනු ලැබේ (ඇමුණුම 03 බලන්න.)

11. තනතුරුවලට පත් කිරීම : අදාළ නොවේ.

12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වල දැක්වෙන පොදු කොන්දේසි වලට පරිබාහිර වන්නාවූ කොන්දේසි :

බන්ධනාගාර නියාමක තනතුරට බඳවා ගන්නා නිලධාරීන් බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් සපයනු ලබන තනිකඩ නිල නිවාස වල අවම වශයෙන් වසර පහක් (05) නතරවී සේවය කළ යුතුය.

බන්ධනාගාර නියාමක තනතුරට පත්වන නිලධාරීන්ට බන්ධනාගාර පර්යේෂණ හා විශෝධන පුහුණු මධ්‍යස්ථානයේදී අදාල රාජකාරි සම්බන්ධව විධිමත් පුහුණුවක් *ලබා දෙන අතර, ඊට අමතරව යුධ හමුදා සෙබලුන්ට සමාන පුහුණුවක්ද ලබාදෙනු ලබයි. දිවයිනේ ඕනෑම බන්ධනාගාර ආයතනයක සේවය කිරීමට බැඳී සිටිය යුතුය. තවද විශේෂ ගණයේ සහ ත්‍රස්තවාදී සිරකරුවන් /සැකකරුවන් රඳවා ඇති බන්ධනාගාර ආයතනවල රාජකාරි කටයුතු වල යොදවනු ඇත. පුහුණුවෙන් පසු වසර 10ක කාලයක් අනිවාර්යයෙන් ඔවුන් බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සේවයේ යෙදෙන බවට බන්ධනාගාර කොමසාරිස් ජනරාල් සමග ගිවිසුමකට ඇතුලත් විය යුතුය. පුහුණු කාලය තුල පුහුණුව අතහැර යන හෝ පුහුණුවෙන් පසු ගිවිසුම ප්‍රකාර නියමිත සේවා කාලයකට පෙර තනතුර අතහැර යන නිලධාරීන් පුහුණුව සඳහා යන සියළුම වියදම් සහ අනෙකුත් වියදම් දෙපාර්තමේන්තුවට ගෙවීමට බැඳී සිටිය යුතුය.

(*පුහුණුව වර්ග කිරීම : පර්යේෂණ විශෝධන මධ්‍යස්ථනයේදී මාස 02ක පුහුණුවක් සහ මාස 10ක කාලයක් සඳහා ප්‍රායෝගික පුහණුවක් ලබා දී අවසානයේදී පුහුණු සහතිකය නිකුත් කරන අතර, ඉන් පසුව ස්ථිර සේවා ස්ථානයට අනුයුක්ත කරනු ලැබේ.)

13. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණ වලට පරිබාහිර වන්නාවූ අර්ථ නිරූපණ

සක්‍රීය සේවා කාලය යනු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියළුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයන් සක්‍රීය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

14. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය :

I. මෙම පරිපාටිය ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින්නන්ට පමණක් අදාළ වේ. නියමිත දිනට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ මගින් ලබා දී ඇති RS -01-2006-A වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබන නිලධාරීන් සියළු දෙනාම ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 04 වන වගන්තියේ විධිවිධාන වලට යටත්ව පහත සඳහන් පරිදි අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

II. සේවා කාලය ගණන්ගනු ලබන්නේ ඒ ඒ තනතුරට හෝ ශ්‍රේණියට පත් කරන ලද දිනය පදනම් කර ගෙනය. කෙසේ වතුදු අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාළ තැනැත්තාගේ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවිය යුතු අතර, එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ව ක්‍රියාත්මක විය යුතුය. එසේම වැටුප් පරිවර්තනයේදී අදාළ තැනැත්තා අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවර නව වැටුප් පියවරට අනුරූපී වීම මත ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4.4 වගන්තිය අනුව ඊළඟ වැටුප් පියවරේ තැබීම ද සිදු නොකළ යුතුය.

III. පෙර තනතුරේ හා වර්තමාන තනතුරේ සේවා කාලය එකතු කළ පසු ගබඩාභාර නිලධාරීන් වසර 12 ක සතුටුදායක සේවා කාලයක් සපුරා ඇත්නම් බඳවා ගැනීමේ පරිපාටිය අනුමත වන දින සිට සැරයන් තනතුරට උසස් කර නියමිත වැටුප් පියවරේ තබනු ලැබේ. (හිඟ වැටුප් රහිතව)

IV. ඊට අඩු සේවා කාලයක් ඇති ගබඩා නිලධාරීන් නියාමක තනතුරට පත්කර හිග වැටුප් ගෙවීමකින් තොරව බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දින සිට අදාළ වැටුප් පියවරේ තැබීම.

15. සැම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභා වේ අංක 1589/30 හා 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පරිපාටික රීති වල දැක්වෙන පොදු කොන්දේසි සහ ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

16. මෙම බඳවා ගැනීමේ පටිපාටියේ විධිවිධාන සලසා නෙමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

සකස් කළේ : අත්සන : ..............................
(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධරයා)

නම : ඩී.ඩබ්ලිව්.යූ. අමරප්‍රේම පරිපාලන නිලධාරි (වැ.ආ.)
තනතුර : බන්ධනාගාර කොමසාරිස් ජනරාල් වෙනුවට
දිනය : 2014/12/02

පරීක්ෂා කළේ : අත්සන ..............................
(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධරයා)

නම : එම්.බී.ආර්. පුෂ්පකුමාර
තනතුර : බන්ධනාගාර කොමසාරිස් (මානව සම්පත්) බන්ධනාගාර කොමසාරිස් ජනරාල් වෙනුවට
දිනය : 2014/12/02

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ..............................
(දෙපාර්තමේන්තු ප්‍රධාන)
නම : චන්ද්‍රරත්න පල්ලේගම
තනතුර : බන්ධනාගාර කොමසාරිස් ජනරාල් බන්ධනාගාර මූලස්ථානය,
නිල මුද්‍රාව : කොළඹ 09.

දිනය : 2014/12/02

යොමු අංකය : MRPR/2/3/17

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ හි බන්ධනාගාර නිලධාරි ................................................ තනතුර සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන : ..............................
නම : ..............................
(ලේකම්)
ජී.එස්. විතානගේ ලේකම් ..................... අමාත්‍යාංශය
නිල මුද්‍රාව : අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය 35 ඒ, ආචාර්ය ඇන්.ඇම් පෙරේරා මාවත, බොරැල්ල, කොළඹ - 08.

දිනය : 2014.12.09

යොමු අංකය : PSC/EST/02-01-18/02/2014

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ හි බන්ධනාගාර නිලධාරි හා සැරයන් සඳහා වන මෙම බඳවා ගැනීමේ පටිපාටිය 2014.11.20 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

අත්සන : ..............................
නම : ..............................
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දිනය : 2014.12.22

නිල මුද්‍රාව : ..............................
ටී. එම්. එල්. සී. සේනාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංකය. 177, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ-05.

**විභාග පිළිබඳ ආකෘතිය**

01. විභාගයේ නම : බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ පොලිස් හා අනෙකුත් නියාමන සේවා සඳහා කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ

02. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය | පැය 03 | 100 % | 40 % |

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 2 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය | | | |
| 1.කාර්යාල පරිපාලනය හා ආයතන සංග්‍රහය | පැය 02 | 100 % | 40 % |
| 2. මුදල් රෙගුලාසි | පැය 02 | 100 % | 40 % |

03. විභාගය පවත්වනු ලබන බලධරයා : බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද යන වග : වසරකට දෙවරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

**කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සඳහා විෂය නිර්දේශය.**

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1වන කාර්යක්ෂමතා කඩඉම | 1. බන්ධනාගාර නියාමකවරුන්ගේ රාජකාරි හා වගකීම් ඇසුරින්<br>2. දෙපාර්තමේන්තු නිත්‍ය නියෝග.<br>3. බන්ධනාගාර ආඥා පනත.<br>ඉහත ඇති සියළුම කරුණු පිළිබඳව දැනුමක් ලබා ගැනීම සඳහා අදාළ ප්‍රශ්ණ පත්‍රය පිළියෙල කරනු ඇත. |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | 1. කාර්යාල පරිපාලනය හා ආයතන සංග්‍රහය.<br>මෙම ප්‍රශ්ණ පත්‍රය ආයතන සංග්‍රහයේ පහත සඳහන් පරිච්ඡේද මත සැකසේ.<br>II වන පරිච්ඡේදය - මාරු කිරීම්<br>VII වන පරිච්ඡේදය - වැටුප්<br>XII වන පරිච්ඡේදය - නිවාඩු<br>XIII වන පරිච්ඡේදය - දුම්රිය බලපත්‍ර<br>XIV වන පරිච්ඡේදය - දිවයින ඇතුලත රාජකාරි ගමන්<br>XVIII වන පරිච්ඡේදය - නිල නිවාස<br>XXXII වන පරිච්ඡේදය - දේශපාලන අයිතිවාසිකම් භුක්ති විඳීම<br>XLVII වන පරිච්ඡේදය - සාමාන්‍ය හැසිරීම හා විනය |

| | |
|---|---|
| | 2. **මුදල් රෙගුලාසි**<br>1. මෙම ප්‍රශ්ණ පත්‍රය මුදල් රෙගුලාසි වල පහත සඳහන් පරිච්ඡේද මත සැකසේ..<br>2. I වන පරිච්ඡේදය - වියදම් හා ආදායම් ඇස්තමේන්තු<br>3. මු.රෙ.1, 2:1, 3, 4, 10, 15 යන වගන්ති<br>4. II වන පරිච්ඡේදය - වියදම්, ආපසුගෙවීම් කපාහැරීම් ආදිය සඳහා අධිකාරි බලය<br>5. මු.රෙ 102, 103, 104 සහ 105 වගන්ති<br>6. III වන පරිච්ඡේදය - මූල්‍ය කළමනාකරණය හා උත්තරදායී බව<br>7. මු.රෙ 138, 139 සහ 140 වගන්ති<br>8. V වන පරිච්ඡේදය - ගෙවීම්<br>9. මු.රෙ 238 වගන්තිය |

සකස් කළේ :
අත්සන :
නම : ඩී.ඩබ්ලිව්.යූ. ද
පරිපාලන නිලධා.
තනතුර : බන්ධනාගාර කොමසාරිස් ජනරාල් වෙනුවට
දිනය :2014/12/02

පරීක්ෂා කළේ :
අත්සන :
නම : එම්.බී.ආර්. පුෂ්පකුමාර
බන්ධනාගාර කොමසාරිස් (මානව සම්පත්)
තනතුර : බන්ධනාගාර කොමසාරිස් ජනරාල් වෙනුවට
දිනය : 2014/12/02

අත්සන :
(දෙපාර්තමේන්තු ප්‍රධාන)
නම : චන්ද්‍රරත්න පල්ලේගම
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
තනතුර : බන්ධනාගාර මූලස්ථානය,
දිනය : 2014/12/02 කොළඹ 09.
නිල මුද්‍රාව :

## ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පිළිබඳ ආකෘතිය.

1. **සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමට අදාළ කරුණ** - බන්ධනාගාර නියාමක තනතුරේ සිට බන්ධනාගාර සැරයන් තනතුරට උසස් කිරීම (ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය මත) පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව 1:5 අනුපාතයට අනුව ජ්‍යෙෂ්ඨතා පිළිවෙලට නිලධාරීන් සම්මුඛ පරීක්ෂණයට භාජනය කරනු ලැබේ.

2. **සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙන ක්ෂේත්‍ර සහ ලකුණු ප්‍රමාණයන්**

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. ජ්‍යෙෂ්ඨත්වය (නියාමක තනතුරේ වසර 05ට පසු) | 60 | අදාළ නොවේ |
| 2. ප්‍රසංශා | 05 | |
| 3. ක්‍රීඩා | 10 | |
| 4. සුභසාධක හා ආගමික කටයුතු | 05 | |
| 5. යහපත් සේවයට වාර්තා කිරීම (පසුගිය වසර 05 තුළ) | 05 | |
| 6. විෂය සමගාමී පාඨමාලා සහ වෙනත් උසස් අධ්‍යාපන සුදුසුකම් | 05 | |
| 7. සේවා කුසලතාවය | 05 | |
| 8. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාව | 05 | |
| එකතුව | 100 | |

03. සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන බලධාරියා : බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

04. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂනය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : පුරප්පාඩු පැවතීම අනුව

සකස් කළේ :
අත්සන : ජී.ඩබ්ලිව්.යූ. අමරප්‍රේම
නම : පරිපාලන නිලධාරි (වැ.ආ.)
තනතුර: බන්ධනාගාර කොමසාරිස් ජනරාල් වෙනුවට
දිනය :2014/12/

පරීක්ෂා කළේ :
අත්සන :
නම : එම්.බී.ආර්. පුෂ්පකුමාර
තනතුර : බන්ධනාගාර කොමසාරිස් (මානව සම්පත්) බන්ධනාගාර කොමසාරිස් ජනරාල් වෙනුවට
දිනය : 2014/12/

අත්සන :
(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම : චන්ද්‍රරත්න පල්ලේගම
තනතුර : බන්ධනාගාර කොමසාරිස් ජනරාල් බන්ධනාගාර මූලස්ථානය,
දිනය : 2014/12/ කොළඹ 09.
නිල මුද්‍රාව :

## විභාග පිළිබඳ ආකෘතිය

01. විභාගයේ නම : ලිඛිත විභාගය අනුව බන්ධනාගාර සැරයන් තනතුරට උසස් කිරීම

02. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| බන්ධනාගාර ආඥා පනත හා බන්ධනාගාර දෙපාර්තමේන්තු නිත්‍ය නියෝග | පැය 02 | 100% | 40% |
| මානව හිමිකම් හා මූලික අයිතිවාසිකම් | පැය 01 | 100% | 40% |

03. විභාගය පවත්වනු ලබන බලධාරියා : විභාග කොමසාරිස් ජනරාල්

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග : පුරප්පාඩු පැවතීම අනුව

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| බන්ධනාගාර ආඥා පනත හා බන්ධනාගාර දෙපාර්තමේන්තු නිත්‍ය නියෝග | සියළුම වගන්ති |
| මානව හිමිකම් හා මූලික අයිතිවාසිකම් | සාමාන්‍ය දැනීමක් අපේක්ෂා කරයි |

සකස් කළේ :
අත්සන : ..........
නම : ඩී.ඩබ්ලිව්.යූ. අමරසෝම
තනතුර : පරිපාලන නිලධාරි
බන්ධනාගාර කොමසාරිස් ජනරාල් වෙනුවට
දිනය : 2014/12/02

පරීක්ෂා කළේ :
අත්සන : ..........
නම : එම්.බී.ආර්. පුෂ්පකුමාර
බන්ධනාගාර කොමසාරිස් (මානව සම්පත්)
තනතුර : බන්ධනාගාර කොමසාරිස් ජනරාල් වෙනුවට
දිනය : 2014/12/02

අත්සන : ..........
(දෙපාර්තමේන්තු ප්‍රධාන)
නම : චන්ද්‍රරත්න පල්ලේගම
තනතුර : බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09.
දිනය : 2014/12/02
නිල මුද්‍රාව : ..........